Page 10 July 2010.qxd 24/07/2010 15:52 Page 1



## An important message about

# Bank of Ceylon London Branch



Gamini Wickremasinghe
Chairman -Bank of Ceylon

It is my pleasure to announce that the Bank of Ceylon's branch in London is now an independent subsidiary. Its re-launch as Bank of Ceylon (UK) Limited is not only historic but also of dramatic significance. It was in 1949 that the London branch was opened as our first branch overseas. Flash forward 61 years and today we have a subsidiary in London, the most prestigious financial center in the world.

In recent years we identified how our presence in London could create the impetus for overseas expansion. Establishing our branch here as an independent subsidiary regulated by the FSA will enable us to reap significant benefits.

Our way forward is one that focuses on keeping abreast of the global market and international best practices, enhancing technology, improving the quality of our service and product depth, sound risk management and dynamic operation through a team of excellent professionals to cater to the changing needs of our customer base. Our London subsidiary will be the new launching pad for Bank of Ceylon to emerge as a global banker. We have valued our loyal customer base here and have continuously strengthened relationships ships with Sri Lankans resident in the U.K. Although in the past our services have been limited we will now be providing a broadened product base which include loans, deposits, treasury products, trade finance and tailored services amongst others. In the near future we intend to provide ATM access to you islandwide.

I believe Bank of Ceylon (UK) Limited will provide its customers with quality products and services in a manner that is prudent and compliant with existing regulations. We are extremely grateful to so many who have worked so hard to enable us to set up here in London, and we look forward very much to your support in the future.

This is a forward step that brings us to an advanced strategic phase of the institutional development of the Bankers to the Nation. BOC will work to capitalise on this and blaze a new trail of excellent banking services in the future.

My best wishes,

**Gamini Wickramasinghe**

# සමනල කන්ද බදු දෙමු හෝටලයකට

රට කරවන්න නම් මසුරන් ඇතුව කැටේ
වටිනා කියන දේ විකිණිය යුතුය රටේ
අමන දනන් කැගැහුවත් හතර වටේ
ඒවා නොවික්කොත් අපි හැම මකර කටේ


දළදා මැදුර අධිකව මිළ කළ හැකි ය
සිරිමා බෝධියේ ලංසුව පැහැදිලි ය
කලුගල් වලට විකුණාගෙන සීගිරි ය
සීගිරි කුරුටු ගී බයිලා කළ හැකි ය

හෝටන් තැන්න දී ක්‍රීඩා පිටිය කට
පවරා සිංහරාජය ලී මෝල කට
දුන් හිඳ ඇල්ල හරවා ජල විදුලි යට
සමනල කන්ද බදු දෙමු හෝටලය කට

**පද - මහාචාර්ය සුනිල් ආරියරත්න**
**ගායනය - විශාරද නන්දා මාලිනී**



# සංස්කෘතිය විකුණාගෙන කෑම ශ්‍රීපාද කඳු මුදුනේ සංචාරක හෝටලයක් තැනීමට යයි!



**ශ්‍රීපාදය මුදුනේ මලුව. 1948 දි ගත් පින්තූරයක්**

ලංකාවේ සිදුවන බොහොමයක් දේවල් වෙන්නෙ රහසිගතවයි. ඒ රටේ යමක් සිද්ධවෙලා බොහොම කාලෙකට පස්සෙ තමයි රටේ මිනිස්සුන්ට ඒව ආරංචි වෙන්නෙ. එතකොට පෙරහැර ගිහිං. රටක පැරණිකම සභ්‍යත්වය මනින්නෙ ඒ රටේ පැරණි දේවල් වලින්. ඒ නිසා ඒ දේවල් ආරක්ෂා කරලා තියන්න ඕන. ඉතිහාසය කියන්නේ ඒ පැරණි දේවල් අනුව අතීතයේ වූ සිදුවීම්. ඒ භාණ්ඩ හා ස්ථාන ඒ ඉතිහාසයේම කොටස්. අතීතය ගැන වර්තමාන පරම්පරාවල් දැනගන්නෙ ඒ පරෙස්සම් කරලා තියපු දේවල් අනුසාරයෙන්. මේක තමයි මුළු ලෝකෙම පිළිගත් මතය. අනෙක ඒ පැරණි දේවල් අද කාලෙ හැටියට වෙනස් කරන්න යන්නෙ නෑ. ඒ තියන විදියටම තියෙන්න අරිනවා. එහෙම වෙනස් කරනවා නම් ඒක බලවත් වරදක් සහ අපරාධයක්.

මම මේ දේවල් කියාගෙන ගියේ ලංකාව ගැන හිතලා. මොකද ඒ රටේ දැන් පුරා වස්තු වලට සළකන්නෙ පරණ බඩු කඩේක විකුණගන්න බැරුව තියන තැලිච්ච, නැමිච්ච, හීරිච්ච බෙලෙක් පිහන් ගාණටයි. එහේ දේසපාලුවොත් එකයි, සාමාන්‍ය මිනිස්සුත් එකයි. දෙගොල්ලන්ටම කෞතුක වස්තුවල පුරා වස්තු වල අගයක් නැහැ. ඒවා තිබුණත් එකයි නැතත් එකයි. ඒ අතරෙ බලනවා ඒවා විකුණලා කීයක් හරි හොයාගන්න පුළුවන්ද කියලා. ලංකාවෙ පුරා වස්තු බොහොමයක් ලංකාවට ආපු සංචාරකයො අරන් ගිහිං. ඒ හොරකම් කරගෙන නෙවෙයි. අපේ මිනිස්සු ඒවා රුපියල් දහයට පහළොවට විකුණලා.

මට මතකයි 2001 වසරේදි එවක තිබුණු ලංකාවෙ රජය ලැස්ති වුණා මූල්‍ය අරමුදලෙන් ගත්තු ණය පියවගන්න කියලා අපේ සිංහරාජ අඩවිය, නකල්ස් කඳු, ශ්‍රීපාද අඩවිය හා කනේරිය කියන ස්වාභාවික වනාන්තර ඇමරිකන් සමාගම් පද්ධතියකට පවරන්න. එතකොට රාජ්‍ය සම්පත් හා පාරිසරික ඇමතිව හිටියේ මහින්ද විජේසේකර. ඒ කාලයේ සිහළ උරුමයේ කැගැහිල්ල නිසා ඒ වැඩේ යටගියා. දැන් ඒක ආයිත් වෙන විදියකට ඇවිත්.

සීගිරියෙ උඩ මැක්ඩොනල්ඩ් රෙස්ටුරන්ට් එකකුයි පීට්සා කඩයකුයි දාන්න දැන් සීගිරි ගල විදලා ලැස්තිවෙන බව පුවත්පත් වල පළවුණා. කාශ්‍යප රජ්ජුරුවන්ට කරන්න අමතක වෙච්ච දේවල්, ඒ අඩුපාඩු සේරම දැන් මේ ආණ්ඩුවෙ හාදයො තමන්ගෙ කල්පනා ශක්තිය මෙහෙයවලා කරන එක ගැන එක අතකට සංතෝෂ වෙන්න ඕන. සමහර විට ප්‍රංශ ආර්ටිස්ට් කෙනෙකුට දේවි දැන් තියන සීගිරි චිත්‍ර ටික මකලා එතන පිකාසෝගෙ ජාතියෙ මොඩර්න් චිත්‍ර ටිකක් අඳින්න. එතකොට ඇමතිට ලොකු ගාණක් අතට එනවා. සංචාරක ව්‍යාපාරෙත් දියුණු වෙනවා.

තවත් දැනට සිද්ධවේගන යන දෙයක් තමයි දළදා මාළිගාවෙ හැඩරුව වෙනස්කරන්න සංස්කෘතිය භාර අමාත්‍යංශයෙන් කටයුතු කරගෙන යෑම. මාළිගාවට ඇතුල් වෙන තැනයි පත්තිරිප්පුව ඇතුලෙයි ඇති පැරණි ගල් කඩලා අයින් කරලා සිමෙන්ති දාලා හදන්න යනවා. සමහර විට මේක පාරවල් හදන පිටරට සමාගමකට දීලා කියලත් හිතෙනවා. මේවට මල්වත්ත අස්ගිරියෙ හාමුදුරුවරුත් සම්බන්ධ නිසා වෙන්න ඇති ඒ උන්වහන්සේලාවත් මේකට මුකුත් කියන්නෙ නෑ.

අපේ රටේ පුරාවස්තු වලට කරලා තියන හානිය ගැන කියන්න වචන නෑ. ඓතිහාසික කූරගල නිදන්වස්තු සේරම කඩලා බිඳලා විනාස කරලා ඒ බෞද්ධ සිද්ධස්ථාන තිබුණු තැන්වලම මුස්ලිම් පල්ලි හදලා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ඒ තැන් වට කරලා, වෙන්කරලා තිබුණත් වැඩක් වුණේ නෑ.

දැන් මට තේරෙනවා ඇයි පුරාණ රජවරු දාගැබ්, චෛත්‍යය හදන කොට ඒ තරම් උසට හැදුවෙ කියලා. ලංකාවෙ මේ ඉන්න මිනිස්සු ගැන හිතලා. රුවන්වැලි මහාසෑය වුනත් පහතින්, කාට හරි අත දික්කරන කිට්ටුවට හැදුව නම් ඒ චෛත්‍යයෙ කොත ගලවගෙන ගිහිං විකුණගෙන එහෙනම් හුගක් කල් ආයිබොවං !

♦ **වෙලේගෙදර රාළ London**

# සැත්කමක් කරවා ගන්නට වඳුරා ගුරු විදුහලට එයි !

## Wounded monkey comes to school to get a surgery done !

ගාල්ල, උණවටුන ගුරු විද්‍යාලයේ ගසක සිටි වඳුරෙක් පන්ති කාමරයක් අසලට පැමිණ එහි ගුරු සිසුන් දෙස බලමින් බොහෝ වාරයක් අතක් පෙන්නුවේය.

වඳුරාගේ වම් අත ඉදිමී තිබිණ. අඟල් හතක් පමණ දිගට කැපී ගිය විශාල තුවාලයකි. මස් පෑදී ඇත. තුවාලය නිසා වඳුරාට ගසෙන් බහින්නට නොහැකි වී ඇත.

ගුරු විද්‍යාලයේ කිසිවෙකුගෙන් තමනට කරදරයක නොවන බව දැන ගත් නිසාදෝ වඳුරා ටිකෙන් ටික ගුරු විද්‍යාලයේ ගණිත අංශයේ පන්ති කාමරයකට රිංගා ගත්තේය. ගුරු සිසු සිසු වියෝ ඉක්මනින් එතැනින් ඉවත්ව ගොස් ඌට ඉඩ දුන්හ.

වඳුරාට කෙසෙල් ගෙඩි ඇතුළු ආහාර ලබා දුන්හ. දින ගණනක් කුස ගින්නේ සිටින්නට ඇතැයි සිතිය හැකි වඳුරා ඒ සියල්ල කෑවේය.


ගුරු විද්‍යාලය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හික්කඩුව කාර්යාලයට වඳුරා පිළිබඳව දැනුම් දුන්නේ ය. උද්‍යාන භාරකරු අසංක මහතාගේ උපදෙස් හා මග පෙන්වීම යටතේ පරිසර සංරක්ෂකයෝ පිරිසක් ගුරු විද්‍යාලයට ආහ. වඳුරා පරෙස්සමෙන් කූඩුවකට ඇතුළු කොට රැගෙන ගියහ. පශු වෛද්‍ය අයෝමි දර්ශිකා මෙනවිය වහාම වඳුරා නිර්වින්දනය කළාය. වඳුරාට පැය එකහමාරක සැත්කමක් කළාය. මැහුම් ගසා, බෙහෙත් දමා, වඳුරා සුවපත්කර, වෛද්‍යවරිය හියාරේ ජෛව විවිධත්ව කේන්ද්‍රය වෙත වඳුරා යොමු කළා ය.

♦ **සජීව විජේවීර - ගාල්ල**

Last week, a monkey on a tree at Unawatuna, Teacher Training College (TTC), Galle, Sri Lanka, was continuously showing its left-arm to the students. He had a terribly swollen arm with a seven-inch deep cut wound, as it was found later, which prevented him moving down the tree.

He slowly climbed down and crawled into a classroom, may be knowing that students would not harm him. Making room for the wounded guest, the students left the class. They gave him bananas and other fruits which he quickly finished showing he hadn't had a meal for many days.

TTC then informed the Wild Life Protection Dept at Hikkaduwa about the monkey. Officials of the WLPD arrived, carefully put the monkey in a cage and took him to the wildlife hospital.





Veterinary surgeon **Ayomi Dharshika** put the monkey under sedation and carried out one and half hour operation to mend his troubled arm.

Later she sent the treated animal to the Bio-diversity Centre in Hiyare, Galle.

**(Report- Sajeeva Vijeweera -Galle correspondent )**
**(Courtesy - Lankadeepa - Sri Lanka)**